

# සම්භාව්‍ය කතාන්දර කලාව

**ලෝකයේ ඕනෑම රටක අතීතයේ සිටම බාල පරපුර විද්වත් ලෝකයට අනුගත කිරීමේදී කතාන්දර සාහිත්‍යය අපූර්ව මාධ්‍යක් ලෙස පිළිගත් බව පෙනී යයි. මන්ද යත් කතාන්දර කලාවේ ගෙත්තම දරුවන් තුල විශ්මය කුතුහලය ආශ්චර්යය, සමග විවිධ මනුෂ්‍ය සම්බන්ධව හා හුරු කරවන හෙයිනි.**

**විජේරත්න පතිරාජ**
**කථිකාචාර්ය - කොළඹ විශ්ව විද්‍යාලය ශ්‍රීපාලි මණ්ඩපය**



ශ්‍රී ලාංකික සංක්‍රමණික අභියෝග අතරින් අපගේ සිංහල බස හා සාහිත්‍යය පිළිබඳ අවකරණය කරමින් ආරම්භ කළ මෙම ලිපි පෙළ මේ වනවිට බසෙහි නොයෙක් දිශානතීන් කෙරෙහි කාලීන වටිනාකම් සහිතව විමසා බැලීම සඳහා වෙසක් පොසෙන් බැති ගී රස හා සිංහබාහු නාට්‍ය රස මිහිර දක්වා අපි ගමන් කළෙමු. බස හා සාහිත්‍යය තරම් ජානියක් සංස්කෘතියෙන් පොහොසත්වීමට බලපාන වෙනත් මානුෂීය දායාදයක් නොමැති තරම්ය. එහි ප්‍රවර්ධනය සඳහා කැපවෙන ජාතිය මිනිස් වර්ගයා ජීවත් කරවීමට ජීවය ලබාදෙයි. අපගේ ඕස්ට්‍රේලියානු සිංහල සංක්‍රමණිකයන්ගේ භාෂා සාහිත්‍ය දායාදය දීනවීමට නො මසුරුව තම දිවිසැරිය කැපකර නොබෝදා අපෙන් සමුගත් ඩී.බී. කුරුප්පු වියතාණන්ට සමස්ථ සිංගරු ප්‍රජාවගේම ප්‍රණාමය හිමි විය යුතුය. පසුගිය සිළුමිණ පුවත්පතෙහි සඳහන් වූ පරිදි ඩී.බී.ට මෙරට ලේඛන කලාවේ දොරටු විවෘත කරදුන් එවක මුල්ම සිංහල වාරික සඟරාවේ සංස්කරණ ලේඛණ ජගත් ජේ එදිරිසිංහ ශූරීන්ට ද එහි ගෞරවය හිමි විය යුතුය.

ජාතියක් ලෙස ලක්ෂ දෙකක් ඉක්මවා ඇතැයි සැලකෙන සංක්‍රමණික පිරිස් අතරන්, ඒ අය අතරින් ඕස්ට්‍රේලියාවේදී ජන්ම ලාභය ලත් 25000 කට වැඩි දූදරු පිරිස අතරත් ස්ව භාවික සිංහල බස හා සාහිත්‍ය පිළබඳවත් කිසියම් ආකාරයක විධිමත් ජාතික වැඩ පිළිවෙලක් සකස් කරගැනීමේ අවශ්‍යතාවක් ඇති බව පෙනී යයි. එය විශේෂයෙන්ම අභියෝගයක්ව දැනෙන්නේ මෙරට ස්වභාවය ඇස් පනාපිට දකින අවස්ථාවලදීය. ඕස්ට්‍රේලියානු දරුවන්ට නොදෙවෙනිව ඉංග්‍රීසි බස හැසිරවීමේ චාතුර්යය ආඩම්භරයට හේතුවකි. ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනය ලබනමින්, ඉංග්‍රීසි සමාජ සත්වයකු බවට පත්වන මේ සිංහල දරුවන් ක්‍රමයෙන් සිංහල බසින් පමණක් නොව වත් පිළිවෙත්වලින්ද එසේ වෙන්වීම පුදුමයක් නොවේ. අපගේ බුද්ධිමත් මව්පියන් තම දරුවන් සමඟ නිවසේදී පමණක් සිංහලෙන් කථා කිරීම මේ සඳහා ඇති එකම විසඳුම ලෙස යොදා ගත්තත්, එයින් සෑහමකට පත්විය හැකිද? ඉංග්‍රීසි බසට සමගාමීව සිංහල භාෂා මාධ්‍ය වර්ධන වැඩ පිළිවෙලක අවශ්‍යතාව සිංහල සමාජය තුළ මතුවෙමින් පවතී. ඕස්ට්‍රේලියානු රජයේ අනුග්‍රහය යටතේ විහාරස්ථාන හා ප්‍රජා මධ්‍යස්ථාන ඔස්සේ සිංහල භාෂා සංවර්ධනයට වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇතත් අපලේ මව්පියන් කී දෙනෙකුට මෙම භාෂා අභියෝගය වැටහී ඇත්දැයි යන්න ගැටළුවකි.

සංක්‍රමණිකයන් ලෙස වෙනත් රටක ජීවත් වීමේදී එහි ඇති සම්පත් හා වරප්‍රසාද භුක්ති විඳිනවා මෙන්ම වෙනත් ජාතියක් ලෙස අප සතු අනන්‍යතාව හා වටිනාකම්ද ඒ රට තුළ ආරක්ෂා කරගැනීම වගකීමක් වන්නේය. එහිදී විශේෂයෙන්ම අපගේ ඊළඟ පරම්පරාවට; අප සතු දේශීය හර පද්ධතීන් උරුම කරදීම ප්‍රධාන ස්ථානයක් ගනී. එය රට-දැය-සමය වැනි ජාතික උරුමයන් දක්වා විහිදී යන්නකි. එවැනි උදාර අරමුණුවලට ප්‍රවේශයක් ලෙස බස සාහිත්‍යය ආගම සුරක්ෂිත වියයුතුය. ස්වකීය කලාන්ට අනුගත විය යුතුය. කලාව මිනිසාගේ හෘද සාක්ෂියක් වන්නේ බස මුල්කරගෙන ලබන වින්දනය පදනම්ව බව ගාර්ෂියා ලෝකා අවධාරනය කර පෙන්වයි.

එදිනෙදා සන්නිවේධනය සඳහා බස හැසිරවීම යනු අදහස් හුවමාරු කරගැනීමක් පමණි. පුද්ගලයෙකු තුළ නිර්මාණාත්මක කුසලතා හා චින්තනය ප්‍රවර්ධනය සඳහා සෞන්දර්යාත්මක සාහිත්‍ය නිර්මාණ කෙරෙහි නැඹුරුවීම අත්‍යාවශ්‍ය වේ. කතාන්දරයක් - කවියක් - ගීතයක් - නාට්‍යයක් - කෙටි කතාවක් - නව කතාවක් රස විඳීම යනු මිනිසා සහ සමාජය දෙස නව දෘෂ්ටියකින් එබී බැලීමකි. නව නළු රසය ආශක්ත කර ගැනීමකි. මෙරට සංක්‍රමණය වූ හෝ මෙහි ඉපදුන දූ දරුවනට අපගේ සාහිත්‍ය නිර්මාණ විඳ ගැනීමට එවන් අවස්ථා සම්පාදනය නොවුනහොත් ඔවුන් අතුරින් සිංහල නිර්මාණකරුවන් බිහි වේ යයි සිතීම සිහිනයකි. ආරම්භක පියවරක් ලෙස සිංහල සාහිත්‍ය සතු විවිධ කතාන්දර සහිත නිර්මාණ විඳ ගැනීමේ අවස්ථාව දරුවන්ගේ ලෝකයට ලඟාකරවීම පිළිගත් විසඳුමකි. සිංහල උගන්වන ඇතැම් ආධාරක පන්තිවල මඩොල්දූව - අංජනම - මහදැනමුත්තා කුඩ හොරා වැනි ජනප්‍රිය කතා පොත් පරිහරනය වන බව දැන ගැනීමෙන් සතුටට පත්වූයෙමි. එහෙත් තවම සිංහල උගන්වන බොහෝ ආයතනවලට ස්ථාපිත පොදු විෂයමාලාවක් හෝ ගුරු මග පෙන්වීමක් ඇති බවක් නොපෙනේ. ඒ ඒ ප්‍රාදේශීය කවුන්සිල් හරහා එවන් ස්ථිරසාර වැඩ පිළිවෙලක් වැඩිහිටි සිංහල සංවිධාන මගින් ඇති කර ගැනීමට කාලය එළඹී ඇත.

ලෝකයේ ඕනෑම රටක අතීතයේ සිටම බාල පරපුර විද්වත් ලෝකයට අනුගත කිරීමේදී කතාන්දර සාහිත්‍යය අපූර්ව මාධ්‍යක් ලෙස පිළිගත් බව පෙනී යයි. මන්ද යත් කතාන්දර කලාවේ ගෙත්තම දරුවන් තුල විශ්මය කුතුහලය ආශ්චර්යය, සමග විවිධ මනුෂ්‍ය සම්බන්ධව හා හුරු කරවන හෙයිනි. අපගේ තුන්වන ලිපියෙන් කතාන්දර කලාව යනු කුමක්දැයි වටහාගත් අපි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ව්‍යාප්ත වන කතා සාහිත්‍යයේ වපසරිය පිළිබඳ මෙහි දී විමසා බැලීම වටී. වීශ්ව සම්භාව්‍ය සියළු කලාවන්ගේ මාතෘ කලාව කතාන්දර කලාව තුළ සැඟවී ඇතැයි සැලකෙන්නේ, අදහස් හුවමාරුව සඳහා බස හසිරිවීමට අනුදත් ආදි මානවයා, තමා ග්‍රහණාය කර ගන්නා අවට ලෝකයේ සියල්ල හසුරුවා ගත් කවුළුව කතාන්දර නිර්මාණය බවට පත් වූ හෙයිනි.

විශ්ව "කතාන්දර ලෝකය" ගැන විමසා බලන කල පෙර අපර දෙදිග ඕනෑම රටක ළමා ලෝකයට ආමන්ත්‍රනය කිරීමේදී යොදාගත් ප්‍රකට කතාන්ර රැසක් අපගේ අවධානයට ලක්වෙයි. සරල බසින් යුක්ත වූත්, සත්ව චරිත සංකේතාත්මකව යොදා ගන්නාවූත් කතාන්දරවලින් ඔබ්බට විවිධ චරිත හා අවස්ථා පාදක කොට ගෙන ලෝක ස්වභාවය හඳුන්වාදීමට යොදාගත් අපූර්ව ගෙත්තමක් ලෙස ඒවා පොදුවේ විග්‍රහ කළ හැකිය. සමස්ථයක් ලෙස ළමයින්ගේ ජීවිතවලට බලපාන විවිධ බේදවාචකවලට මුහුණපාන සම වයස් කණ්ඩායම්වල අත්දැකීම් මානසිකව විඳගන්නා අවස්ථාවලින් කතා ජන........ අලංකාර වෙයි. ළමයින් ගැන නොසිතන වැඩිහිටියන්ගේ දූෂ්ට ගති ලක්ෂණ නිසා අසරණවන ළමයින්ට ආත්ම ශක්තියෙන් යුක්තව එවන් අභියෝග ජය ගැනීමට පෙර හනුවක් ලබා දීමද කතාන්දර සතු අධ්‍යාපන ගුණයකි. කතාන්දර කීපයක් ඇසුරෙන් මෙම ලක්ෂණ විමසා බැලිය හැක.

විශ්ව කතාන්දර අතර "එක්දහස් එක් රැය" නම් අරාබි කතා පොතක එන ප්‍රකට චීන මූලාශ්‍රයක් වූ "ඇලඩින්ගේ පුදුම පහන" ප්‍රමුඛස්ථානයක් ගනී. මුස්ථාපා චීන ගමක ජීවත් වූ දුප්පත් ඇඳුම් මසන්නෙකි. ඇලඩින් ඔහුගේ පුතාය. පියා හදිසියේ මරණයට පත්වීමෙන් ඔහු මවත් සමඟ අසරණ තත්වයට පත් වෙයි දිනක් ඇලඩින් හමුවීමට අමුත්තකු පැමිණේ. තමා පියාගේ සහෝදරයකු බවත් අසරණ වූ පවුලට උදව් කිරීමට පැමිණි බවක් පවසා මුදල් ටිකක් දී ගියේ නැවත එන බව පවසමිනි. නැවත එන බව පවසමිනි. නැවත දිනක ඔහු පැමිණ පුතා වෙනුවෙන් සාප්පුවක් මිලදී ගන්නා බවට මවද රවටා පුතා සමග නගරයට පිටත් වෙති. එහිදී අලංකාර උයනක් බැලීමට ඇති බව පවසා පාලු උමගත් විවෘත කොට, තමා කියන අන්දමට කටයුතු කළහොත් පොහොසත් විය හැකි බව පෙන්වා දෙයි. මහාකාරයකු වූ ඔහුට රැවටුනු ඇලඩින් ඔහු කියූ ආකාරයට අඳුරු ගුහාවේ කෙළවර ඇති අලංකාර පහන ගෙන ඒමට එකඟ වෙයි. කරදරයක් වුවහොත් ආරක්ෂාවට මුද්දක්ද ලබාදෙයි. සියළු බාදක මැද ඔහු පහන රැගෙන ආවත්, ඔහුව ගොඩ නොගෙන පහණ පමණක් ඉල්ලූ හෙයින්, ඇලඩින් පහන දීම ප්‍රතික්ෂේප කරයි. තරහ ගිය මායාකරු ඇලඩින් ගුහාවේ තනිකර එය වසා දැම්මේය. බුද්ධිය යොදා ගත් ඇලඩින් තමාට දුන් මුද්දට අරක්ගත් යෝධයා මිත්‍ර කරනෙ ගොඩට විත් පහනේ බලයෙන් සිතූ පැතූ සම්පත් දිනාගෙන රාජකුමාරයෙක් බවට පත්වෙයි.

විශ්ව කතාන්දර කලාවෙහි තවත් ප්‍රකට නිර්මාණයක් නම් "සින්ඩරෙල්ලා" කතාවයි. සුරංගනා කතාන්දර ගණයට වැටෙන මෙහි චරිත හා සිද්ධිවලදී සුරංගනාවන් අභිබවා මනුෂ්‍ය චරිතවල සැඟවුණු චරිත ඉස්මතු වී ඇත. සින්ඩරෙල්ලා තම මවගේ මරණයෙන්